වයඹ පළාත් සභා පාසල්වල සේවය කරන ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු -2026

2026/01/07 දින සිට ක්‍රියාත්මක වන පරිදි නිකුත් කර ඇති වයඹ පළාත් සභා පාසල්වල සේවය කරන ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු අවසන් නියෝග සම්බන්ධයෙන් අතෘප්තියට පත් වූ නිලධාරීන් සිටී නම් ඔවුන්ට, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 256 වන වගන්තිය ප්‍රකාරව එහි දක්වා ඇති ක්‍රියාපටිපාටියට අනුව වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ස්ථාන මාරු නියෝග ප්‍රසිද්ධ කරන ලද දින සිට දින 14 ක් ඇතුලත 16 වන පරිශිෂ්ටය මඟින් අභියාචනයක් ඉදිරිපත් කිරීමේ හැකියාව පවතින බව කාරුණිකව දන්වමි.

ඩබ්.එම්.සී.කේ.වන්නිනායක
ලේකම්
වයඹ ප්‍රධාන අමාත්‍යාංශය

වයඹ පළාත් සභා පාසල්වල සේවය කරන ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු -2026

01. වයඹ පළාත් සභා පාසල්වල සේවය කරන ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු 2026.01.07 දින සිට ක්‍රියාත්මක කරන බව කාරුණිකව දන්වමි.

02.ඒ අනුව ස්ථාන මාරු නියෝග ලද සියලුම නිලධාරීන් තම අනුප්‍රාප්තික නිලධාරියා පැමිණෙන තෙක් නොසිට 2026.01.21 දිනට පෙර නව සේවා ස්ථානය වෙත වාර්තා කල යුතු බව අවධාරණය කරමි.

ඩබ්.එම්.සී.කේ.වන්නිනායක
ලේකම්
වයඹ ප්‍රධාන අමාත්‍යාංශය